## 268 තණ්හාවෙන් බොඳවූ

තණ්හාවෙන් බොඳවූ පැරණි ගති
මුල් සිඳ සැණෙකින් ඉවත දමා
නව ජීවනයේ ලකුණු පැළඳගෙන
පිය නංවමු නව මඟෙහි අමා

මිසදිටු අව ගති දුර හැරදා
දෙවිඳුන් වෙත නෙත් සිත් පහදා
දෙව් වරමින් පව් මල පිසදා
පිරිසිදු වමු කෙලෙසුන් පරදා

අවිඳු අඳුර ගත සිතෙහි වෙලී
අපේ ගුණ දහම් පහත හෙලී
විලි බිය අප හැර ඉවත බැලී
සුමඟට පිවිසෙමු හතික යළී

වමු අපි කිතුහිමි ගුණ ඇසුවෝ
මතු නොවැ එතුමන් අනුවැ ගියෝ
වදහළ සදහම් මඟ දුටුවෝ
විමුක්තියේ උරුමය ලැබුවෝ

බොරු ගතු කේලාම් ඉවත දමා
මුව සරසා සත් බසින් අමා
මෙත් සිසිලෙන් කෝ ගින්න නිවා
සොහොයුරු පෙම තර කරමු සැමා